# ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යාපන තක්සේරුකරණය සහ ඇගයීම පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව

## (2018/2019)

මෙම පාඨමාලාව පාසල් පද්ධතියේ, පළාත් මට්ටමේ, කොට්ඨාස මට්ටමේ සහ පාසල් මට්ටමේ විභාග/පරීක්ෂණ සැලසුම් කරන, සංවිධානය කරන, ප්‍රශ්න පත්‍ර සකසන හා ප්‍රතිඵල විශ්ලේෂණ වැනි අධ්‍යාපන කාර්යවල නිරතවන ගුරු අධ්‍යාපනඥයින්ට, ගුරුවරුන්ට, ගුරු උපදේශකවරුන්ට සහ අනෙකුත් අධ්‍යාපන නිලධාරිවරුන්ට වැදගත්වන සේ සැලසුම් කර ඇත.

**පාඨමාලාවේ අන්තර්ගතය**

1. අධ්‍යාපන තක්සේරුකරණය හා ඇගයීම පිළිබඳ මූලිකාංග
2. ඉගෙනුම් තක්සේරුකරණය සඳහා සූදානම් කිරීම
3. මිනුම් උපකරණ සැකසීම,භාවිතය හා සාධනය මැනීම
4. පරීක්ෂණ ඇගයීම තත්ත්ව සහතිකකරණය හා සම්මතකරණය
5. ශිෂ්‍ය අභියෝග්‍යතාව මැනීම
6. කාර්ය සාධන තක්සේරුකරණය / කුසලතා මැනීම
7. ඉගෙනුම සඳහා තක්සේරුකරණය
8. ආවේදනික ගතිලක්ෂණ තක්සේරුකරණය
9. පරීක්ෂණ/ විභාග පරිපාලනය
10. අධ්‍යාපන සංඛ්‍යානය සහ සංඛ්‍යානමය මෘදුකාංග
11. පරීක්ෂණ ප්‍රතිඵල අර්ථ කථනය

**අවශ්‍ය සුදුසුකම්**

පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහිත උපාධිධාරී ගුරුවරයකු/ පුහුණු ගුරුවරයකු/ ගුරු උපදේශකවරයකු, ගුරු අධ්‍යාපනනඥ සේවයේ නිලධාරියකු/ අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියකු/ වෙනත් පිළිගත් අධ්‍යාපන ආයතනයක අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරියකු ලෙස කටයුතු කිරීම හෝ ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු වීම

| | | |
|---|---|---|
| කාලසීමාව | - | එක් අවුරුදු පාඨමාලාවකි (සති අන්තවල සහ පාසල් නිවාඩු දින) |
| මාධ්‍යය | - | සිංහල |

**තෝරා ගැනීමේ පදනම**

සේවා කාලය සැලකිල්ලට ගෙන එහි ප්‍රමුඛතාව අනුව සීමිත පිරිසක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින් ඉහළම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

| | | |
|---|---|---|
| පාඨමාලා ගාස්තු | - | රු. 30,000/- |
| ලියාපදිංචි ගාස්තු | - | රු. 1,000/- |
| ඉල්ලුම්පත්‍ර සඳහා ගාස්තුව | - | රු. 200/- |

(මෙයට අමතර ව අවසාන විභගය සඳහා අනුමත විභාග ගාස්තු ගෙවිය යුතුය.)

**අයදුම් කිරීම**

ලංකා බැංකුවේ මහරගම ශාඛාවේ ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ගිණුම් අංක 607628 දරන ගිණුමට රු. 200/- ක මුදලක් බැර කර ලබා ගත් කුවිතාන්සිය, (චෙක්පත්, මුදල් ඇණවුම් භාර ගනු නොලැබේ.) ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත්‍රය, A4 ප්‍රමාණයේ කඩදාසියක තනිපැත්තට සකසා සම්පූර්ණ කර, ඔබේ නම හා ලිපිනය ලියූ රු. 10/- වටිනා මුද්දර ඇල වූ 9"X4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ද සමග **" අධ්‍යක්ෂ, විභාග දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම"** යන ලිපිනයට **2018 මාර්තු 16** හෝ එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවර **"අධ්‍යාපන තක්සේරුකරණය හා ඇගයීම පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව"** යනුවෙන් සඳහන් කළ යුතුය. මෙම පුවත්පත් දැන්වීම හා අදාළ අයදුම්පත්‍රය www.nie.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබා ගත හැකිය.

ආචාර්ය ටී.ඒ.ආර්.ජේ. ගුණසේකර
අධ්‍යක්ෂ ජනරාල්